# දිගාමඩුල්ලේ ජනශ්‍රැති

(අම්පාර දිස්ත්‍රික්කය ඇසුරින්)

එම්. ඒ. ඩී. ආර්. මාතොටආරච්චි

GS/MA/SIN/3028/07

දර්ශනපති 2017

# දිගාමඩුල්ලේ ජනශ්‍රැති

(අම්පාර දිස්ත්‍රික්කය ඇසුරින්)

එම්. ඒ. ඩී. ආර්. මාතොටආරච්චි
GS/MA/SIN/3028/07

දර්ශනපති 2017

# දිගාමඬුල්ලේ ජනශ්‍රැති

(අම්පාර දිස්ත්‍රික්කය ඇසුරින්)

එම්. ඒ. ඩී. ආර්. මාතොටආරච්චි

GS/MA/SIN/3028/07

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධි

පර්යේෂණයට අදාළ ශාස්ත්‍රීය නිබන්ධය

2017

## පර්යේෂක ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුසුමලතා ලංකාමුල්ල මහත්මියගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත් මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

........................ ...............................................

GS/MA/SIN/ 3028/07 දිනය

## උපදේශකතුමියගේ ප්‍රකාශය

මාතොට ආරච්චිගේ දිස්නා රුවන්ගනී මාතොට ආරච්චි (GS/MA/SIN/3028/07) නම් වන දර්ශනපති උපාධි අපේක්ෂිකාව විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත් මාගේ උපදේශකත්වය යටතේ සිදුකල මෙම පර්යේෂණ නිබන්ධය විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත්, වාචික පරීක්ෂණයේදී පරීක්ෂක මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද සියලු සංශෝධන සහිතව නිබන්ධනය සකසා ඇති බවත් සහතික කරමි.

.................................... ............................................

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුසුමලතා ලංකාමුල්ල දිනය

## අධ්‍යයනාංශ ප්‍රධානතුමාගේ ප්‍රකාශය

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයන විෂය යටතේ දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි වී සිටින මාතොට ආරච්චිගේ දිස්නා රුවන්ගනී මාතොට ආරච්චි (GS/MA/SIN/3028/07) විසින් දිගාමඬුල්ලේ ජනශ්‍රැති (අම්පාර දිස්ත්‍රික්කය ඇසුරින්) යන මාතෘකාව යටතේ ඉදිරිපත් කරන ලද ස්වාධීන පර්යේෂණ නිබන්ධය විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බව නිර්දේශ කරමි.

………………………………………… ……………………………

අධ්‍යයනාංශ ප්‍රධාන, දිනය

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය,

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,

ගංගොඩවිල,

නුගේගොඩ.

# පිදුම

නෙක රුදුරු

ලෝකයේ,

සොඳුරු තැන්

පෙන් වූ

දයාබර අම්මාට

සෙනෙහසින්....

# උපකාරානුස්මෘති

දිගාමඩුල්ලේ ජනශ්‍රැති (අම්පාර දිස්ත්‍රික්කය ඇසුරින්) යන මෙය දර්ශනපති උපාධිය පූරණය කරනු වස් ඉදිරිපත් කරන පර්යේෂණාත්මක නිබන්ධය යි. මෙම අධ්‍යයනය සිදු කිරීමට මහත් වූ වෑයමක් දැරීමට සිදු විය.

ප්‍රථම ව නිබන්ධය ලිවීමට අවශ්‍ය පසුබිම සකසා දෙමින් මෙහි දී ඇති වූ සියලු ගැටලු නිරාකරණය කර දුන් මාගේ උපදේශකතුමිය වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුසුමලතා ලංකාමුල්ල මහත්මිය ගෞරවයෙන් සිහිපත් කරමි.

එමෙන් ම නිබන්ධය පෝෂණය කළ යුතු තැන් පෙන්වා දෙමින් නිරන්තරයෙන් උපදෙස් සැපයූ මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දරයන් ද මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහයන් ද සිහිපත් කරනුයේ ගෞරවයෙනි. තවද අධ්‍යයනාංශ ප්‍රධාන මහාචාර්ය රත්නසිරි අරංගල, මහාචාර්ය සුනිල් ආරියරත්න, මහාචාර්ය ඥානදාස පෙරේරා, මහාචාර්ය තිස්ස කාරියවසම් යන ආචාර්යවරුන්ට ද පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිනිය, මහාචාර්ය හේමන්ති රණසිංහ මහත්මියටද මාගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරමි.

මේ තාක් වූ අධ්‍යාපන ගමනේ සියලු ගුරු මව්පියවරුන් ද භක්ති පූර්වකව සිහිපත් කරමි.

තමන් සතු දැනුමෙන් මා පෝෂණය කළ දිගාමඩුල්ලේ උරුමයන් අදටත් රකින පර්යේෂණය සඳහා තොරතුරු සැපයූ සියල්ලන්ටත් මාගේ හද පිරි ප්‍රණාමය පුදමි. දීර්ඝායු පතමි.

ඉගෙනීමේ එල නිතර සිහි කරමින් සියලු මාර්ග වෙත අප යොමු කළ ශාස්ත්‍රපති උපාධිය දක්වා මා කැඳවා අපෙන් වෙන් ව ගිය මාගේ දයාබර පියාණන්ට නිවන් මඟට පින් අනුමෝදන් කරමි.

නිති දිරි දෙමින් මා ළඟ සිටින මාගේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් තම දිවි කැප කරන මාගේ ආදරණීය මෑණියන් මට ඉමහත් සවියකි.

මාගේ සියලු කටයුතු සඳහා නිති කැපවෙන මා දයාබර සැමියා ද සොහොයුරන් දෙදෙනා ද අධ්‍යයන කටයුතු සඳහා බාධා නොකළ ආදරණීය දියණිය ද පුතුන් දෙදෙනා ද සිහිපත් කරමි.

මෙකී පර්යේෂණය සඳහා තොරතුරු ඒකරාශී කිරීමේ දී බෙහෙවින් උපකාර කළ ආරියරත්න එදිරිසිංහ මහතාටත් සමන් දිසානායක, සමන් මාණික්කආරච්චි යන මා හිතවත් මාධ්‍යවේදී දෙපළට ද සංජීව සොයුරා ඇතුළු පවුලේ සැමටත් වසන්ත සොයුරාටත් චාන්දනී ගුණතිලක සොයුරියටත් හද පිරි ප්‍රණාමය පුදමි.

මෙම පර්යේෂණ නිබන්ධය සඳහා ලිඛිත මූලාශ්‍රය එක්රැස් කිරීමේ දී නිරන්තර සහය ලබාදුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පුස්තකාලය, අම්පාර මහජන පුස්තකාලය, මා විද්‍යාලයීය පුස්තකාලය යන ඈ පුස්තකාලයන්හි කාර්ය මණ්ඩලවලට මාගේ තුති පුදමි.

විවිධ බාධක හමුවේ දැඩි වෙහෙසක් දරා පරිගණක කටයුතු කර නිබන්ධය මුද්‍රණය කරදුන් "චානක කමියුනිකේෂන්" ආයතනයට ද මාගේ ස්තුතිය පිරිනමමි.

මෙම නිබන්ධය සැකසීමේ දී මා හට නන් අයුරින් උපකාර කළ සියලු සහෘදයනට මාගේ ප්‍රණාමය පුදමි.

මාතොට ආරච්චිගේ දිස්නා රුවන්ගනී මාතොට ආරච්චි .

# අනුක්‍රමණිකා

| | පිටුව |
|---|---|
| අනුක්‍රමණිකා | i-ii |
| පර්යේෂණ සංක්ෂිප්තය | iii-iv |
| **පළමුවන පරිච්ඡේදය** | **01-12** |
| 1.1 හැඳින්වීම. | |
| 1.2 පර්යේෂණ ගැටලුව | |
| 1.3 උපන්‍යාසය | |
| 1.4 අධ්‍යයනයේ අරමුණු | |
| 1.5 පරමාර්ථ | |
| 1.6 විෂය සීමාව | |
| 1.7 පර්යේෂණ ක්‍රමවේදය | |
| 1.8 පරිච්ඡේදකරණය | |
| 1.9 සංකල්පීය අධ්‍යයන සැලැස්ම | |
| **දෙවන පරිච්ඡේදය.** | **13-28** |
| 2. සාහිත්‍ය විමර්ශනය | |
| 2.1 ජනශ්‍රැති හැඳින්වීම සහ සංකල්ප විග්‍රහය | |
| 2.2 පූර්ව අධ්‍යයන | |
| **තෙවන පරිච්ඡේදය.** | **29-46** |
| 3. අධ්‍යයන ප්‍රදේශය හැඳින්වීම | |
| 3.1 භූගෝලීය පසුබිම | |
| 3.1.1 අධ්‍යයන ප්‍රදේශයේ භෞතික පසුබිම | |
| 3.1.2 මානව කටයුතු | |
| 3.2 ජන සංයුතිය | |
| 3.3 ඓතිහාසික පසුබිම | |

**සිව්වන පරිච්ඡේදය** **47-184**

4. ප්‍රදේශයේ ප්‍රචලිත ජනශ්‍රැති

4.1. ජන කවිය හැඳින්වීම

4.1.1 දිගා මඬුල්ලේ ජන කවි

4.2 දිගාමඬුල්ලේ ජන කතා

4.3 ඇදහිලි හා විශ්වාස

4.3.1 දිගාමඬුල්ලේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය (හේන් ගොවිතැන) හා බැඳි ඇදහිලි හා විශ්වාස.

4.3.2 දිගාමඬුල්ලේ දෙවැනි වගාව හා බැඳි ඇදහිලි හා විශ්වාස.

4.3.3 වැව්ගම්පත්තුවේ භෝග ආරක්ෂණ විධි

4.3.4 දඩයම හා සම්බන්ධ ඇදහිලි හා විශ්වාස

4.3.5 යන්ත්‍ර මන්ත්‍ර

4.3.6 ගෘහ ජීවිතය හා සම්බන්ධ ඇදහිලි හා විශ්වාස

4.3.7 දිගාමඬුල්ලේ පූජා කර්ම

4.4 දිගාමඬුල්ලේ ජන ක්‍රීඩා

4.5 දිගාමඬුල්ලේ ජන ව්‍යවහාර

පස්වන පරිච්ඡේදය

සමාලෝචනය 185

උපග්‍රන්ථ 188

ඡායා රූප නාමාවලිය 193

සිතියම් නාමාවලිය 198

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 201

සම්මුඛ සාකච්ඡා 209

# දිගාමඬුල්ලේ ජනශ්‍රැති (අම්පාර දිස්ත්‍රික්කය ඇසුරින්)

**එම්. ඒ. ඩී. ආර්. මාතොට ආරච්චි**

**පර්යේෂණ සංක්ෂිප්තය**

වර්තමානය වන විට දියුණු කෘෂිකාර්මික ජනපදයක් වන දිගාමඩුල්ල ඓතිහාසික වශයෙන් වැදගත්කමකින් යුක්තය. පෘථුල ප්‍රදේශයක් පුරා විහිදෙන මෙම ප්‍රදේශය ස්වාධීන සංස්කෘතිකාංගයන්ගෙන් සැකසී ඇත. එබැවින් පාරම්පරික ඥාන සම්භාරයක් මේ ප්‍රදේශය තුළ පවතියි. මේ තාක් අවධානයට ලක් වී නොමැති බොහෝ ජනශ්‍රැති අම්පාර පරිපාලන කලාපය තුළ පවතී.

මෙම අධ්‍යයනය සඳහා තොරතුරු එක්රැස් කිරීමේ දී දිගාමඬුල්ලේ විවිධ ප්‍රදේශවල පැරැන්නන්ගෙන් අසන්නට ලැබුණු ජනකවි, ජනකතා, ජන ඇදහිලි හා විශ්වාස, ජන ක්‍රීඩා හා ජන ව්‍යවහාර පිළිබඳව විමසන විට අද වන විටත් වැව්ගම්පත්තුවේ ඉපැරණි සංස්කෘතිකාංග පවතින බවට නිදසුන් සපයයි.

දිගාමඬුල්ලේ විවිධ ප්‍රදේශවල ජනකවි පිළිබඳ විමර්ශනයේ දී දිගාමඬුල්ලේ ඉපැරණි සංස්කෘතිය මෙන් ම සංස්කෘතික සභ්‍යත්වය ගැබ් කරගත් ජනකවි රැසක් හමු විය. ඉන් සමහරක් ඔවුන්ගේ හඬින් ම සුරක්ෂිත කිරීමට හැකි විය. මේවා මෙම ප්‍රදේශයේ ඉපැරණි උරුමයන් ය. ජන කතාවලින් ප්‍රදේශය පිළිබඳව එහි භූගෝලීය, ඓතිහාසික වටිනාකම් පිළිබඳව තොරතුරු රැසක් හමුවිය. පානම ප්‍රදේශයෙන් හමු වූ විශේෂිත පුද්ගලයන්ගෙන් ලබාගත් තොරතුරු ඒවාට නිදසුන් ය.

ඇදහිලි හා විශ්වාස පිළිබඳ තතු සෙවීමේ දී හේන, කුඹුර පිළිබඳ වගා ක්‍රම, ආරක්ෂණ විධි, භව භෝග විවිධාකාර වූ ශාන්තිකර්ම ආදී විෂයන් පිළිබඳව ඔවුන් තුළ පවතින පාරම්පරික ඥානය අධ්‍යයනය කිරීමට ද අවස්ථාව ලැබිණි.

දිගාමඬුල්ලේ ජන ක්‍රීඩා විෂයෙහිලා ගත්ත ද එය මනාව පසක් වේ. පානම ප්‍රදේශයේ දී එම ප්‍රදේශයට ම විශේෂිත වූ කෙමෙන් වැළලී යන ජන ක්‍රීඩා රැසක් හමු විය.

පානම්පත්තුවේ වසරක් පාසා පැවැත්වෙන අං කෙළිය එහි අනන්‍යතාව පැහැදිලි කරන්නකි. එය ක්‍රීඩාවක් මෙන් ම ගම රටට සෙත ශාන්තිය අත්කරදෙන ශාන්තිකර්මයක් ද වේ.

දිගාමඬුල්ලට ආගන්තුක ව පැමිණෙන්නෙකුට සිතාගැනීමට පවා නොහැකි ජන ව්‍යවහාරයක් මේ ප්‍රදේශයේ ජනතාව වහරති. එය ඔවුන් හා වාසය කිරීමෙන් ම දැන හඳුනාගත යුත්තකි.

එමෙන්ම මෙම ජනශ්‍රැති ඒකරාශී කිරීම තුළින් පාරම්පරික ඥාන සම්භාරයන් සංරක්ෂණය කිරිමට හැකි විය. මෙතෙක් අසන්නට දකින්නට නොලැබුණු, අම්පාර දිස්ත්‍රික්කයට පමණක් සීමා වූ සංස්කෘතික වටිනාකම් ජනශ්‍රැති මෙම පර්යේෂණය මගින් ඉදිරිපත් කෙරේ.